# 5 ආඛ්‍යාත පද

වාක්‍යයක ප්‍රධාන කොටස් දෙකකි. උක්තය හා ආඛ්‍යාතය යනු ඒ කොටස් දෙක යි. උක්තය යනු වාක්‍යයේ ක්‍රියාවෙන් කියවෙන තැනැත්තා හෝ දෙය යි. ආඛ්‍යාතය යනු උක්තය විසින් කරනු ලබන ක්‍රියාව යි. එහෙයින් එය අවසාන ක්‍රියා නමින් ද හැඳින්වේ. උක්තය යම් සේවයක් වාක්‍යයකට සලසන්නේ ද, ඊට සමාන සේවයක් ආඛ්‍යාතයෙන් ද සිදු වේ. උක්තයට අනුකූලව පෙනී සිටිමින් කාල, පුරුෂ, වචන තිසි පරිදි ගැළපීමෙන් ආඛ්‍යාතය වාක්‍යයක අදහස පැහැදිලි ලෙස ඉදිරිපත් කිරීමට දායක වන අතර එයට සමාප්ති අර්ථයක් ද ලබාදේ.

පහත දැක්වෙන්නේ **සඳසිරිපුර ශ්‍රී ධර්මවර්ධන** පාරිවෙණික ශිෂ්‍ය සමිතියේ මාසික සභා වාරයේ කරන ලද සාකච්ඡාවෙන් උපුටා ගත් කොටසකි.

සභාපති හිමි: "න්‍යායපත්‍රානුකූල ව මීළඟට තිබෙන්නේ "**නිර්මාණාත්මක ලිපි**" ඉදිරිපත් කිරීමේ වාරය යි. ඒ අනුව පළමු නිර්මාණාත්මක ලිපිය ඉදිරිපත් කිරීම සඳහා දෙවන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ගැමුණුපුර සාරද ආයුෂ්මතුන්ට ආරාධනා කර සිටිනවා."

ගැමුණුපුර සාරද හිමි: "මුළු සභාවෙන් අවසර යි. මා මේ සභාව ඉදිරියට පැමිණියේ නිර්මාණාත්මක ලිපියක් ඉදිරිපත් කිරීමට යි. එය සාවධාන ව අසා සිටිනු ඇතැ'යි මා බලාපොරොත්තු වෙනවා. මගේ ලිපියේ මාතෘකාව "**වසන්කල සිරි විසිතුරු**" යන්න යි.

සොබා දහමේ සැබෑ අලංකාරය ලොවට විදහා පාන අසිරිමත් කාලය වසන්ත කාලය යි. ගිම්හාන උණුසුමින් වියළී ගිය ජීව ලෝකය ම පණ ලබා ගන්නේ වසන්ත කාලයේ දී ය. ගොවි බිමෙන් ශස්‍ය නෙළා ගන්නා මිනිස්සු එහි සතුට විඳිති. ගිම්හානයේ ආහාර නොමැති ව පීඩා විඳි සිව්පාවෝ සතුටු සිතින් ආහාර සොයා යති. කුල්මත් වූ විහඟුන්ගේ නාදය දසත පැතිරී යයි. සුවඳ විහිදුවමින් පුෂ්පයෝ විකසිත වෙති. පිපුණු පුෂ්පයන්ගේ රොන් උරන්නට ගුමුගුමු නදින් ඔකඳ වූ මී මැසි කැල වේගයෙන් පියඹා එති. මෙසේ සොබා සිරියෙන් අලංකාරවත් වූ වසන්ත කාලය කවරකුගේ නම් නෙත් සිත් පැහැර නොගන්නේ ද? මාගේ ලිපිය කියවා අවසාන යි.

අසා සිටි සියලු දෙනාට ම ස්තුතියි!"

ඉහත ලිපියෙන් උපුටා ගත් මේ වැකි දෙක දෙස බලන්න.

1. සිවුපාවෝ සතුටු සිතින් ආහාර සොයා යති.
2. සුවඳ විහිදුවමින් පුෂ්පයෝ විකසිත වෙති.

මෙහි පළමු වැකියේ **සොයා යති** යන ක්‍රියාව සිව්පාවුන් විසින් සිදු කරන්නක් බව දක්නට ලැබේ. එය කිරීමකි.

දෙවන වැකියේ **විකසිත වෙති** යන ක්‍රියාවෙන් පුෂ්පයෝ තමා විසින් ම විකසිත වන බව හැඟවේ. එය ඉබේ ම සිදු වන දෙයකි. මෙසේ සිදු කිරීමක් හෝ සිදු වීමක් හඟවන පද "ආඛ්‍යාත පද" ලෙස හැඳින්වේ.

**5.1 ක්‍රියාකාරකම**

ඉහත ලිපියේ ඇතුළත්, කිරීමක් සහ සිදු වීමක් හඟවන ආඛ්‍යාත පද ඇති වැකි තෝරා වෙන වෙන ම ලියන්න.

## ආඛ්‍යාත පද සැකසෙන අයුරු:

5.1 ක්‍රියා මූලයකට සමාප්ති සූචක ප්‍රත්‍යයක් එකතු වීමෙන් ආඛ්‍යාත පදයක් සෑදේ.

| ක්‍රියා මූලය | | ප්‍රත්‍ය | | ආඛ්‍යාත පදය |
|---|---|---|---|---|
| කර | + | යි | = | කරයි |
| කර | + | ති | = | කරති |
| කර | + | හි | = | කරහි |
| කර | + | හු | = | කරහු |
| කර | + | මි | = | කරමි |
| කර | + | මු | = | කරමු |

**5.2 ක්‍රියාකාරකම**

පහත ආඛ්‍යාත පදවල ක්‍රියා මූලය සොයා ලියන්න.

1) ගයති 2) රඟයි 3) දුවයි
4) සරසයි 5) සලමු 6) කොඳුරමි
7) බලති 8) දෙසහු 9) කසති 10) දිනමි

### ආඛ්‍යාත පදවල කාල / වචන / පුරුෂ භේදය

වර්තමාන කාලය (ලිය ධාතුව)

| පුරුෂ | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | ලියයි | ලියති |
| මධ්‍යම පුරුෂ | ලියහි | ලියහු |
| උත්තම පුරුෂ | ලියමි | ලියමු |

අතීත කාලය

| පුරුෂ | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | ලිව්වේ ය | ලිව්වෝ ය |
| මධ්‍යම පුරුෂ | ලිව්වෙහි | ලිව්වෙහු |
| උත්තම පුරුෂ | ලිව්වෙමි | ලිව්වෙමු |

අනාගත කාලය

| පුරුෂ | ඒකවචන | බහුවචන |
|---|---|---|
| ප්‍රථම පුරුෂ | ලියන්නේ ය | ලියන්නෝ ය |
| මධ්‍යම පුරුෂ | ලියන්නහි | ලියන්නහු |
| උත්තම පුරුෂ | ලියන්නෙමි | ලියන්නෙමු |

**5.3 ක්‍රියාකාරකම**

පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු ආඛ්‍යාත රූපය තෝරා ලියන්න.

**කරති, ගැයුහු, කිව්වෝ ය, ගියෙමු, ලියයි, කරන්නෙමි, පැමිණියේ ය, වඩින්නෝ ය, ගලති, සදන්නෝ ය, ඇදෙති, ගන්නෙහි, උපන්නේ ය, නැටුවෙමි, පිවිසෙයි.**

i) ලේඛකයා පොත් ..........................

ii) උපාසක මහතා ඊයේ සවස විහාරයට ......................

iii) රහල් හිමියෝ මෙහෙට දම් දෙසුමකට .......................

iv) පක්ෂීහු නිලඹර අරා පියාසර .......................

v) සියලු නදීහු වක් ව ...................

vi) රුක් වඩුවෝ අලංකාර ලෙස ලී බඩු .....................

vii) බල සේනාව ජය ලබමින් ඉදිරියට ..................

viii) නුඹලා සතුටින් ගීයක් ......................

ix) අපි භෝජන සංග්‍රහයෙන් පසු ව සතුටින් විසිර .....................

x) මම වර්තමානයෙන් අනාගතය කරා ගමන් ................

xi) තෝ වරදෙහි සමාව ....................

xii) මට්ටකුණ්ඩලී දෙව්ලොව ......................

## 5.2 විධි ක්‍රියා

**විධානයක් හෝ අණකිරීමක් ප්‍රකාශ කරන ක්‍රියාපද විධික්‍රියා යනුවෙන් හැඳින්වේ.**

| | | | | |
|---|---|---|---|---|
| පැ හැ ස ර ණි ය | මිණි | පැමිණිය | කොත් | අගට |
| බ ඳ කි කි ණි ය | දද | ගිගිණිය | විමන් | වට |
| නො ව පැ ර ණි ය | වන | රමණිය | විටින් | විට |
| සැ ළ ලි හි ණි ය | වදු | කැලණිය | | පුරවරට |

මේ කවියෙන්, කොත් අගට පැමිණි ප්‍රභාවත් මැණික් ඇති, මිණි ගෙඩි බැඳි කොඩිවලින් යුක්ත වූ විමානයන් අවට ඇති, පැරණි නොවී විටින් විට රම්‍ය වන්නා වූ ස්වභාවයෙන් යුත් කැලණිය නම් උතුම් පුරවරයට පිවිසෙන ලෙස සැළලිහිණියාට පවසා ඇත.

මෙය උපුටා ගන්නා ලද්දේ තොටගමුවේ ශ්‍රී රාහුල මාහිමියන් විසින් රචනා කරන ලද සැළලිහිණි සන්දේශයෙනි. මෙහි **පිවිසෙන්න** යන විධානය සිදු කර ඇත්තේ "වදු" යන ක්‍රියාවෙනි. සිංහල භාෂාවේ ඇති එවැනි ක්‍රියා නැතහොත් ආඛ්‍යාත විධි ක්‍රියා යනුවෙන් හැඳින්වේ.

ළඟ සිටින කෙනෙකුට හෝ දුර සිටින කෙනෙකුට හෝ කරනු ලබන විධානය ක්‍රම දෙකකින් කළ හැකි ය.

ආදරයෙන් කරන විධානය
අනාදරයෙන් කරන විධානය

ආදරය ගෞරවය සුහදබව හැඟවෙන සේ කෙරෙන විධානය ආදරයෙන් කරන විධානය යි.

උදා :-
- පුතේ මෙහි එන්න.
- ස්වාමින් වහන්ස, දානයට වඩින්න.
- මෙහි වාඩි වෙන්න .

කෝපය, තරහව, අප්‍රසාදය, හැඟවෙන සේ කෙරෙන විධානය අනාදරයෙන් කරන විධානය යි.

උදා :-
- මෙතනින් පිට ව යනු
- වහා මා ළඟට එනු

5.3 ක්‍රියාකාරකම

i) පහත සඳහන් වාක්‍යවල හිස්තැනට සුදුසු විධි ක්‍රියා පද යොදන්න.

i) හිස්වැසුම් , පාවහන් ගලවා....................
ii) මෙහි කුණු දමන්න..................
iii) දකුණු පසින් ඉදිරියට.............
iv) දුම්බීම......................
v) විහාරස්ථානය තුළ නිශ්ශබ්ද ව ..............
vi) පනින්න පෙර සිතා ..............
vii) දෙව් ලොව යන්න..................
viii) මෙතනින් ඉවතට.....................
xi) සෙමින් රිය.......................
x) කරුණාකර ගමන් මලු පරීක්ෂා කිරීමට..................

ii. පහත සඳහන් පද්‍ය සහ ගීත පාඨවල යෙදී ඇති විධික්‍රියා තෝරා ලියන්න.

(අ) " අන්න බලන් සඳ රන්තැටියෙන් සුදු සීත ගඟුල් ගලනා......."

(ආ) "කරව පියාසර සකි කොන්ත ගං තොටින් "

(ඇ) "අයන්න කියන්න ලොවට ම ඇහෙන්න "

(ඈ) "නරඹ මිතුර තගෙ නෙත සිත සතුටු කොට "

(ඉ) "පිළිගන්න මම ඡන්න ඇමති වෙමි
මා එක්ක ගියෙ ඊයේ සිදුහත් හිමි"

(ඊ) "ජයවද්දන පුරවර දනු මිතුරු තුමා "

(උ) "එන්න මඳ නලේ ගොස් පවසන්න දුක මගේ......."

(ඌ) "සුබ මොහොතින් වැද හස රද එවෙහෙරට "

(එ) "දුවේ පුතේ දඟ නොකරන් මාගේ "

(ඒ) "බල සුබ නිමිති පෙර මග නැකතටත් වැඩි "

iii. විධි ක්‍රියා පද සහිත වාක්‍ය 5ක් නිර්මාණය කරන්න.